ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

චක්‍රලේඛ අංකය : PS/EAD/Circular/4/2024 මගේ අංකය: PS/EAD/04/24
2024 අප්‍රේල් මස 22 වන දින

**සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්**
**සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්**
**සියලුම ආණ්ඩුකාර ලේකම්වරුන්**
**සියලුම දිසාපති/ දිස්ත්‍රික් ලේකම්වරුන්**
**සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්**
**සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්**
**රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරුන්**
**අනෙකුත් සියලුම රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවල ප්‍රධානීන් වෙත,**

**රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සංගණනය (2024 වර්ෂය)**

රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා සැලසුම් සකස් කිරීම සඳහා අවශ්‍ය නිල සංඛ්‍යාති සකස් කිරීමේ වගකීම පැවරී ඇති ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳව තොරතුරු රැස් කිරීම සඳහා පවත්වනු ලබන "රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සංගණනය" 2024 මැයි මස 28 වන අඟහරුවාදා දින පැවැත්වීමට සැලසුම් කර ඇත.

02. මෙවර සංගණනයේ දී පහත කාණ්ඩවලට අයත් රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතනවල සේවයේ නියුක්ත ස්ථිර, තාවකාලික, අනියම් සහ කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදෙන සෑම තරාතිරමකටම අයත් කාර්ය මණ්ඩලය සම්බන්ධ තොරතුරු රැස් කෙරේ.

මධ්‍යම රජය යටතට ගැනෙන,

- අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ඇතුළු රාජ්‍ය ආයතන
- ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය සංස්ථා, රාජ්‍ය සමාගම් ඇතුළු අර්ධ රාජ්‍ය ආයතන
- අමාත්‍යාංශයක් යටතට නොගැනෙන ආයතන

පළාත් සභා යටතට ගැනෙන,

- පළාත් අමාත්‍යාංශ, පළාත් දෙපාර්තමේන්තු, පළාත් ප්‍රඥප්තිවලින් පිහිටුවන ලද ආයතන ඇතුළු පළාත් රාජ්‍ය ආයතන
- පළාත් අර්ධ රාජ්‍ය ආයතන
- පළාත් සභාව යටතේ ඇති පළාත් අමාත්‍යාංශයක් යටතට නොගැනෙන ආයතන

03. සියලුම රේඛීය අමාත්‍යාංශ, පළාත් ප්‍රධාන ලේකම් කාර්යාල, දිස්ත්‍රික් ලේකම් කාර්යාල නියෝජනය කරමින් ප්‍රධාන සංගණන සම්බන්ධීකරණ නිලධාරීන් මේ වන විට පත් කරගෙන ඇති අතර සියලු දෙපාර්තමේන්තු ඇතුළු රාජ්‍ය ආයතන මෙන්ම සියලුම සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, අමාත්‍යාංශයක් යටතට නොගැනෙන ස්වාධීන ආයතන නියෝජනය කරමින් ආයතනික සංගණන සම්බන්ධීකරණ නිලධාරීන් ද පත් කරගෙන ඇත. එම නිලධාරීන්ගේ සහය ලබාගනිමින් මේ වන විට සියලු රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන ලැයිස්තු සකස් කිරීම ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් අවසන් කර ඇත. ඒ අයුරින්ම,



ගාලු මුවදොර, කොළඹ 01
காலி முகத்திடல், கொழும்பு 01
Galle Face, Colombo 01
දුරකථන / தொலைபேசி / Telephones ++ 94 (0) 11 2354418, ++ 94 (0) 11 2473873
ෆැක්ස් / தொலைநகல் / Fax ++ 94 11 2446657
ඊ-තැපෑල / மின்-அஞ்சல் / e-mail prsec@presidentsoffice.lk

ඔබගේ ආයතනය මෙන්ම ඔබ යටතට ගැනෙන සියලු ආයතනයන් නිසි පරිදි මෙහෙයවමින් 2024 මැයි මස 28 දින තුළ පූර්ණ ආවරණයක් සහිතව රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳව සංගණනය පැවැත්වීම සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය සහය ඔබ විසින් ලබා දෙනු ඇතැයි අපේක්ෂා කරමි.

04. ඔබ ආයතනය තුළ මෙම සංගණනය සිදු කරන ආකාරය පිළිබඳව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සංගණන සම්බන්ධීකරණ නිලධාරීන් දැනුවත් කිරීම සිදු කරනු ඇති අතර ඔබගේ අධීක්ෂණය යටතේ වන ආයතනවල මෙම සංගණනය පැවැත්වීමට අදාළව පහත සඳහන් කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන ඔබ විසින් යෙදිය යුතු වේ.

i. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ඔබ වෙත ලබා දෙන සංගණන ලේඛන සියල්ල ඔබගේ අධීක්ෂණය යටතේ වන ආයතනවලට සංගණන දිනට යටත් පිරිසෙයින් සතියකට පෙර ලැබීමට සැලැස්වීම හා එම ලේඛන ලැබී ඇති බව තහවුරු කර ගැනීම.

ii. 2024 මැයි මස 28 වන දින ඔබගේ අධීක්ෂණය යටතේ ඇති සියලු ආයතනවල සංගණන තොරතුරු රැස් කිරීමේ කාර්යය නිවැරදිවත්, කාර්යක්ෂමවත් සිදු වන බව තහවුරු කර ගැනීම.

iii. ඔබගේ අධීක්ෂණය යටතේ ඇති සෑම ආයතනයකම ඉහත 02 ඡේදය යටතේ සඳහන් සෑම සේවා නියුක්තිකයකුගේම තොරතුරු මෙම සංගණනයට ඇතුළත් කර ඇති බව තහවුරු කර ගැනීම.

iv. සංගණන තොරතුරු කාලීනව හා නිවැරදිව ප්‍රකාශයට පත් කිරීමට හැකි වන පරිදි සම්පූර්ණ කරන ලද සංගණන ප්‍රශ්නාවලි හා සාරාංශ වාර්තා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ උපදෙස් ප්‍රකාර නියමිත කාල වකවානුව තුළ එම දෙපාර්තමේන්තුවට ලබා දීමට කටයුතු කිරීම.

05. මෙම චක්‍රලේඛයේ දෙමළ භාෂා පරිවර්තනයක් මේ සමඟ අමුණා ඇත.

06. රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ අත්‍යවශ්‍ය මූලික තොරතුරු ලබාගැනීම සඳහා පවත්වන මෙම සංගණනයේ සමස්ත ක්‍රියාවලිය සාර්ථක කරගැනීම සඳහා ඔබගේ සහයෝගය ලබාදීම අවශ්‍ය බව අවධාරණය කරන අතර කාලීන හා ජාතික වැදගත්කමකින් යුත් මෙම කර්තව්‍යය සඳහා ප්‍රමුඛතාවය ලබාදෙමින් මෙම සංගණනය සාර්ථක කරගැනීම සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට ඔබගේ උපරිම සහයෝගය ලබාදෙන ලෙස දන්වා සිටිමි.

ඊ එම් එස් බී ඒකනායක
ජනාධිපති ලේකම්

දුරකතන: + 94 11 2354420 ෆැක්ස්: + 94 11 2446657
විද්‍යුත් තැපැල: prsec@presidentsoffice.lk

පිටපත්:
01. අග්‍රාමාත්‍ය ලේකම්
02. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
03. විගණකාධිපති